(අටවැනි පාර්ලිමේන්තුව - තෙවැනි සභාවාරය)

අංක 78.]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2019 ජූලි 23 වැනි අඟහරුවාදා අ.භා. 1.00 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **කරු ජයසූරිය මහතා,** කථානායකතුමා

ගරු **ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

ගරු **සෙල්වම් අඩෛක්කලනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමා

---

ගරු **රනිල් වික්‍රමසිංහ මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමා

ගරු **තලතා අතුකෝරල මහත්මිය,** අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමිය

ගරු **වජිර අබේවර්ධන මහතා,** අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **ගයන්ත කරුණාතිලක මහතා,** ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **රවී කරුණානායක මහතා,** විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍යතුමා

ගරු **මනෝ ගනේසන් මහතා,** ජාතික ඒකාබද්ධතා, රාජ්‍ය භාෂා, සමාජ ප්‍රගති සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **දයා ගමගේ මහතා,** ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමා

ගරු **පලනි දිගම්බරම් මහතා,** කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමා

ගරු **ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,** බුද්ධ ශාසන හා වයඹ සංවර්ධන අමාත්‍යතුමා

ගරු **හරින් ප්‍රනාන්දු මහතා,** විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍යතුමා

ගරු **ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා,** රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යතුමා

ගරු **තිලක් මාරපන මහතා,** විදේශ කටයුතු අමාත්‍යතුමා

ගරු **සාගල රත්නායක මහතා,** වරාය හා නාවික කටයුතු සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමා

ගරු **පාඨලී චම්පික රණවක මහතා,** මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමා

ගරු **මලික් සමරවික්‍රම මහතා,** සංවර්ධන උපායමාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා

ගරු **අබ්දුල් හලීම් මහතා,** තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **කබීර් හෂීම් මහතා,** මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛණිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමා

ගරු **පී. හැරිසන් මහතා,** කෘෂිකර්ම, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,** අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන ආර්ථික ප්‍රතිසංස්කරණ සහ පොදු සැපයීම් අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) වී. රාධක්‍රිෂ්ණන් මහතා,** අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන විශේෂ ප්‍රදේශ සංවර්ධන අමාත්‍යතුමා

ගරු **රුවන් විජයවර්ධන මහතා,** අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන ජනමාධ්‍ය අමාත්‍යතුමා සහ ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රවීන්ද්‍ර සමරවීර මහතා,** අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමා

ගරු **සුජීව සේනසිංහ මහතා,** අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා

ගරු **අශෝක් අබේසිංහ මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජේ. සී. අලවතුවල මහතා,** අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රංජිත් අලුවිහාරේ මහතා,** සංචාරක සංවර්ධන, වනජීවී හා ක්‍රිස්තියානි ආගමික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **වසන්ත අලුවිහාරේ මහතා,** කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලකී ජයවර්ධන මහතා,** නගර සැලසුම් හා ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඒ. ඩී. ප්‍රේමදාස මහතා,** විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉරාන් වික්‍රමරත්න මහතා,** මුදල් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **දිලිප් වෙදආරච්චි මහතා,** ධීවර හා ජලජ සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **වඩිවේල් සුරේෂ් මහතා,** වැවිලි කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **වසන්ත සේනානායක මහතා,** විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) අනෝමා ගමගේ මහත්මිය,** ඛනිජ තෙල් සම්පත් සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමිය

ගරු **එඩ්වඩ් ගුණසේකර මහතා,** ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නලින් බණ්ඩාර ජයමහ මහතා,** සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **බුද්ධික පතිරණ මහතා,** කර්මාන්ත හා වාණිජ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **කරුණාරත්න පරණවිතාන මහතා,** නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු නියෝජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා**

ගරු **මහින්ද අමරවීර මහතා**

ගරු **තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**

ගරු **දිළුම් අමුණුගම මහතා**

ගරු **(ආචාර්ය) සරත් අමුණුගම මහතා**

ගරු **ලසන්ත අලගියවන්න මහතා**

ගරු **ඩලස් අලහප්පෙරුම මහතා**

ගරු **ආනන්ද අලුත්ගමගේ මහතා**

ගරු **මහින්දානන්ද අලුත්ගමගේ මහතා**

ගරු **(ආචාර්ය) එස්. එම්. මොහමඩ් ඉස්මායිල් මහතා**

ගරු **ටී. බී. ඒකනායක මහතා**

ගරු **ෆයිසාල් කාසිම් මහතා**

ගරු **වේලු කුමාර් මහතා**

ගරු **නාලක ප්‍රසාද් කොලොන්නෙ මහතා**

ගරු **කවීන්දිරන් කෝඩීස්වරන් මහතා**

ගරු **චන්ද්‍රසිරි ගජදීර මහතා**

ගරු **චන්දිම ගමගේ මහතා**

ගරු **පියසේන ගමගේ මහතා**

ගරු **උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**

ගරු **නිහාල් ගලප්පත්ති මහතා**

ගරු **දිනේෂ් ගුණවර්ධන මහතා**

ගරු **(ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**

ගරු **පද්ම උදයශාන්ත ගුණසේකර මහතා**

ගරු **එස්. එම්. චන්ද්‍රසේන මහතා**

ගරු **ඩී. වී. චානක මහතා**

ගරු **සිසිර ජයකොඩි මහතා**

ගරු **(වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**

ගරු අනුරාධ ජයරත්න මහතා

ගරු පියංකර ජයරත්න මහතා

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා

ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා

ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා

ගරු එම්. එස්. තෞෆික් මහතා

ගරු සිරිනාල් ද මෙල් මහතා

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා

ගරු අනුර දිසානායක මහතා

ගරු විමලවීර දිසානායක මහතා

ගරු වීරකුමාර දිසානායක මහතා

ගරු සාලින්ද දිසානායක මහතා

ගරු එච්. ආර්. සාරතී දුෂ්මන්ත මහතා

ගරු ඩග්ලස් දේවානන්ද මහතා

ගරු එස්. බී. නාවින්න මහතා

ගරු මනූෂ නානායක්කාර මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු මුහම්මදු නසීර් මහතා

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු කේ. කේ. පියදාස මහතා

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා

ගරු ඩිලාන් පෙරේරා මහතා

ගරු සනත් නිශාන්ත පෙරේරා මහතා

ගරු සුජිත් සංජය පෙරේරා මහතා

ගරු අශෝක ප්‍රියන්ත මහතා

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය

ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා

ගරු එස්. ප්‍රේමරත්න මහතා

ගරු පාලිත රන්ගේ බණ්ඩාර මහතා

ගරු ශාන්ත බණ්ඩාර මහතා

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා

ගරු තාරානාත් බස්නායක මහතා

ගරු තාරක බාලසූරිය මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු කේ. කාදර් මස්තාන් මහතා

ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා

ගරු නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා

ගරු ෆයිසර් මුස්තාපා මහතා

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි

ගරු බිමල් රත්නායක මහතා

ගරු සී. බී. රත්නායක මහතා

ගරු ලොහාන් රත්වත්තේ මහතා

ගරු ප්‍රසන්න රණතුංග මහතා

ගරු ප්‍රසන්න රණවීර මහතා

ගරු කෙහෙලිය රඹුක්වැල්ල මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු මහින්ද රාජපක්ෂ මහතා, පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා

ගරු අංගජන් රාමනාදන් මහතා

ගරු නිමල් ලාන්සා මහතා

ගරු ජානක වක්කුඹුර මහතා

ගරු විදුර වික්‍රමනායක මහතා

ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා

ගරු ඒ. ඒ. විජේතුංග මහතා

ගරු ලක්ෂ්මන් ආනන්ද විජේමාන්න මහතා

ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු කංචන විජේසේකර මහතා

ගරු ඩුලිප් විජේසේකර මහතා

ගරු හේෂා විතානගේ මහතා

ගරු චන්දිම වීරක්කොඩි මහතා

ගරු විමල් වීරවංශ මහතා

ගරු කුමාර වෙල්ගම මහතා

ගරු එස්. ශ්‍රීතරන් මහතා

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා

ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය

ගරු ජයන්ත සමරවීර මහතා

ගරු සන්දිත් සමරසිංහ මහතා

ගරු රාජවරෝදයම් සම්පන්දන් මහතා

ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා

ගරු රංජිත් සියඹලාපිටිය මහතා

ගරු මුත්තු සිවලිංගම් මහතා

ගරු තිලංග සුමතිපාල මහතා

ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා

ගරු මාවෙ සෝ. සේනාධිරාජා මහතා

ගරු චතුර සංදීප සේනාරත්න මහතා

ගරු ශෙහාන් සේමසිංහ මහතා

ගරු විජිත් විජයමුණි සොයිසා මහතා

ගරු ඩී. එම්. ස්වාමිනාදන් මහතා

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා

ගරු එච්. එම්. එම්. හරීස් මහතා

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා

ගරු කනක හේරත් මහතා

ගරු විජිත හේරත් මහතා

ගරු ඒ. එච්. එම්. ෆවුසි මහතා

ගරු ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා මහතා

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

නීල් ඉද්දවල මහතා, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, සහකාර මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන :** කථානායකවරයා විසින් මතු පළවන නිවේදනය කරන ලදී:—

“පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 124 (1) හි විධිවිධානවල සහ 2016 පෙබරවාරි 26 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරගත් යෝජනාවේ හි කුමක් සඳහන්ව තිබුණ ද, 2019 ජූලි 12 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව ප්‍රකාරව, උසස් නිලතල පිළිබඳ කාරක සභාවේ සේවය කිරීම සඳහා මතු සඳහන් මන්ත්‍රීවරයන් ද තේරීම් කාරක සභාව විසින් නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

ගරු රවී කරුණානායක මහතා

ගරු ඩග්ලස් දේවානන්ද මහතා.”

**2. ලිපිලේඛනාදිය පිළිගැන්වීම :** (1) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 2018 වර්ෂය සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව පිළිගන්වා, එම වාර්තාව අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(2) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 2018 වර්ෂය සඳහා ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව පිළිගන්වා, එම වාර්තාව තිරසර සංවර්ධනය හා පරිසරය සහ ස්වභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(3) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්—

(i) 2017 වර්ෂය සඳහා ලෝහෝර් ආර්යා ණය අරමුදලේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2019 වර්ෂය සඳහා වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව

පිළිගන්වා, එම වාර්තා රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(4) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 2017 වර්ෂය සඳහා පොල් වගාකිරීමේ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව පිළිගන්වා, එම වාර්තාව කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(5) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 2017 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව පිළිගන්වා, එම වාර්තාව ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(6) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 2014, 2015, 2016 සහ 2017 වර්ෂ සඳහා ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ්හි වාර්ෂික වාර්තා පිළිගන්වා, එම වාර්තා ව්‍යාපාර හා වාණිජ පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(7) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 2018 වර්ෂය සඳහා කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව පිළිගන්වා, එම වාර්තාව අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**3. කාරක සභා වාර්තා පිළිගැන්වීම** : (1) අභ්‍යන්තර පරිපාලන හා රාජ්‍ය කළමනාකරණ පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ගරු ගාමිණී ලොකුගේ මහතා වෙනුවෙන් එහි සාමාජික මන්ත්‍රී ගරු නිහාල් ගලප්පත්ති මහතා විසින්, එම කාරක සභාව වෙත යොමු කරන ලද, "1955 අංක 22 දරන පරිපාලන දිස්ත්‍රික්ක පනතේ 3 වගන්තිය යටතේ වූ යෝජනාව" සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

(2) ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ගරු හර්ෂණ රාජකරුණා මහතා විසින්, එම කාරක සභාව වෙත යොමු කරන ලද,—

(i) 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝග;

(ii) 2018 වර්ෂය සඳහා ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

(iii) 2016 වර්ෂය සඳහා ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව; සහ

(iv) 2018 වර්ෂය සඳහා සංවර්ධන උපායමාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

**4. මහජන පෙත්සම් පිළිගැන්වීම :**

(i) ගම්පොල, මහර, "නැඩිසා නිවාස", අංක 42 දරන ස්ථානයෙහි පදිංචි එම්. ඒ. සුනිල් ජයලත් මහතාගෙන් ලැබුණු 2019.04.27 දිනැති පෙත්සම; සහ

(ii) තෙල්දෙණිය පොලිස් ස්ථානයේ සේවය කරන ප්‍රධාන පොලිස් පරීක්ෂක පී. ඩබ්ලිව්. නීලරත්න මහතාගෙන් ලැබුණු 2019.02.13 දිනැති පෙත්සම

ගරු ලකී ජයවර්ධන මහතා විසින් පිළිගන්වන ලදී.

30 (10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**5. පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 1) :** ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා, ගරු චන්දිම වීරක්කොඩි මහතා විසින් ස්ථිර කරනු ලබමින් ඉදිරිපත් කළ යෝජනාව,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"1971 අංක 29 දරන නිවාඩු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව, පළමුවැනි වර කියවන ලදින්, මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

අංක 52(6) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ වාර්තා කිරීම පිණිස පනත් කෙටුම්පත අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා වෙත පවරන ලදී.

**6. පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 2) :** ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා, ගරු බිමල් රත්නායක මහතා විසින් ස්ථිර කරනු ලබමින් ඉදිරිපත් කළ යෝජනාව,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"2000 අංක 8 දරන ශ්‍රී ලංකා වරලත් ප්‍රවාහන ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව, පළමුවැනි වර කියවන ලදින්, මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

අංක 52(6) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ වාර්තා කිරීම පිණිස පනත් කෙටුම්පත ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා වෙත පවරන ලදී.

(අ.භා. 2.26 ට නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමා මූලාසනාරූඪ විය.)

**7. පරිපාලන දිස්ත්‍රික්ක පනත යටතේ යෝජනාව :** අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 1955 අංක 22 දරන පරිපාලන දිස්ත්‍රික්ක පනතේ 3 වගන්තිය යටතේ:—

(අ) මෙහි උපලේඛනයේ විස්තර කරඇති "වරාය නගරය කොළඹ" යනුවෙන් හඳුන්වනු ලබන ගොඩ කරන ලද භූමි ප්‍රදේශය, 1955 අංක 22 දරන පරිපාලන දිස්ත්‍රික්ක පනතේ පළමුවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොළඹ පරිපාලන දිස්ත්‍රික්කයේ බල ප්‍රදේශය සහ සීමා තුළට ඇතුළත් කිරීම මඟින්, කොළඹ පරිපාලන දිස්ත්‍රික්කයේ බල ප්‍රදේශය සහ සීමා වෙනස් කරනු ලැබිය යුතු බවට; සහ

(ආ) ඒ ගොඩ කරන ලද භූමි ප්‍රදේශය, කොළඹ පරිපාලන දිස්ත්‍රික්කයේ කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට එක් කරනු ලැබිය යුතු බවටත්

මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

### උපලේඛනය

මැනුම්පති විසින් පිළියෙළ කරන ලද 2019.06.11 දිනැති අංක CO/DSO/2019/370 දරන අනුරේඛනයේ නිරූපණය කර ඇති, බස්නාහිර පළාතේ කොළඹ, මෙහි පහත දැක්වෙන සම්බන්ධ කිරීමේ ලක්ෂ්‍යයන්හි පිහිටා ඇති සහ කැබලි අංක 2 සිට කැබලි අංක 7 ලෙස සලකුණු කොට ඇති හෙක්ටයාර 446.6153කින් සමන්විත "වරාය නගරය කොළඹ" යනුවෙන් හඳුන්වනු ලබන, පහත දැක්වෙන පරිදි මායිම් වූ භූමි ප්‍රදේශය:—

| **සම්බන්ධ වන ලක්ෂ්‍යය - කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බස්නාහිර මායිම** | **නැගෙනහිර ඛණ්ඩාංක** | **උතුරු ඛණ්ඩාංක** |
|---|---|---|
| උතුරින් සම්බන්ධ වන ලක්ෂ්‍යය | 396913.476 | 492847.764 |
| දකුණින් සම්බන්ධ වන ලක්ෂ්‍යය | 397077.037 | 492290.222 |

*(සමුද්දේශ ඛණ්ඩාංක පද්ධතිය: Srilanka Grid 1999)*

**1.** කැබලි අංක **2 :** ප්‍රමාණය හෙක්ටයාර **155.8376**

උතුරට - කැබලි අංක 6 සහ 1, කොළඹ වරාය සහ චෛත්‍යය පාර
නැගෙනහිරට - කැබලි අංක 1, කොළඹ වරාය, චෛත්‍යය පාර, ඉන්දියානු සාගරය සහ කැබලි අංක 7
දකුණට - ඉන්දියානු සාගරය, කැබලි අංක 7, 6 සහ 3
බටහිරට - කැබලි අංක 6, 3 සහ 6

**2.** කැබලි අංක **3 :** ප්‍රමාණය හෙක්ටයාර **15.0933**

උතුරට - කැබලි අංක 2
නැගෙනහිරට - කැබලි අංක 2 සහ 6
දකුණට - කැබලි අංක 6 සහ 4
බටහිරට - කැබලි අංක 4 සහ 6

**3.** කැබලි අංක **4 :** ප්‍රමාණය හෙක්ටයාර **113.5311**

උතුරට - කැබලි අංක 6 සහ 3
නැගෙනහිරට - කැබලි අංක 3 සහ 6
දකුණට - කැබලි අංක 6, 5 සහ 6
බටහිරට - කැබලි අංක 6, 5 සහ 6

**4.** කැබලි අංක **5 :** ප්‍රමාණය හෙක්ටයාර **14.7856**

උතුරට - කැබලි අංක 6 සහ 4
නැගෙනහිරට - කැබලි අංක 6 සහ 4
දකුණට - කැබලි අංක 6
බටහිරට - කැබලි අංක 6

**5.** කැබලි අංක **6 :** ප්‍රමාණය හෙක්ටයාර **101.1038**

උතුරට - කැබලි අංක 7, 1, 2, 3, 4, 5, 4, 3 සහ 2
නැගෙනහිරට - කැබලි අංක 1, 2, 3, 4, 5, 2 සහ 7

දකුණට - කැබලි අංක 2 සහ 7
බටහිරට - කැබලි අංක 2 සහ 7

**6.** කැබලි අංක **7 :** ප්‍රමාණය හෙක්ටයාර **46.2639**

උතුරට - ඉන්දියානු සාගරය, කැබලි අංක 1, 6 සහ 2
නැගෙනහිරට - කැබලි අංක 1, 6 සහ 2 සහ ඉන්දියානු සාගරය
දකුණට - ඉන්දියානු සාගරය
බටහිරට - ඉන්දියානු සාගරය

''ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා මූලාසනාරූඪ විය යුතුය''යි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 3.19 ට ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා මූලාසනාරූඪ විය.)

''ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා මූලාසනාරූඪ විය යුතුය''යි, ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය, ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා ස්ථිර කරමින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 4.16 ට ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**8. කල් තැබීම (සිවිල් ආරක්ෂක සේවා නිලධාරීන්ට විශ්‍රාම වැටුප් ඇතුළු දීමනා ලබා දීම) :** ''මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය''යි ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාද විය.

''ගරු හේෂා විතානගේ මහතා මූලාසනාරූඪ විය යුතුය''යි, අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන ජනමාධ්‍ය අමාත්‍යවරයා සහ ආරක්ෂක රාජ්‍ය අමාත්‍යවරයා යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 6.03 ට ගරු හේෂා විතානගේ මහතා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය; අ.භා. 6.40 ට, 2019 ජුලි 24 වැනි බදාදා අ.භා. 1.00 වනතෙක් පාර්ලිමේන්තුව කල් ගියේය.